**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

**(පරිසර අමාත්‍යාංශය)**

## මාතර දිස්ත්‍රික් කාර්යාල පහසුකම් සඳහා ගොඩනැගිල්ලක් බදු කුලී පදනම මත ලබා ගැනීම.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය සඳහා පහත සඳහන් අවශ්‍යතා අනුව මාතර දිස්ත්‍රික්කයෙන් බදු හෝ කුලී පදනම මත නිවසක් හෝ ගොඩනැගිලක් අවශ්‍ය වේ.

1. වර්ග අඩි 2000 ක පමණ ගොඩනැගිල්ල.
2. වර්ග අඩි 200 බැගින් කාමර 03 ක්.
3. කෑම කාමරයක්.
4. වර්ග අඩි 1200ක පමණ විවෘත අවකාශයක්.
5. අවම වශයෙන් වැසිකිලි 2 ක්.
6. වායු සමීකරණ පහසුකම් සහිත සහ පොලොව ටයිල් සහිත ස්ථානයක්.
7. සේවකයන්ට පහසුවෙන් ලගා විය හැකි වීම. (ප්‍රධාන මාර්ගයේ සිට)
8. ආරක්ෂාව සහිත ස්ථානයක් වීම.
9. පහල මාලයක් වීම. (කාර්යාලීය යතුරුපැදිය ඇති නිසාවෙන්)
10. වාහන නැවැත්වීමේ පහසුකම්.

**සැලකිය යුතුයි - ඉහත සඳහන් කල 01 සිට 10 දක්වා කොන්දේසි වලට අමතරව පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

- අදාළ නිවස හෝ ගොඩනැගිල්ල බදු දීමට හෝ කුලියට දීමට නීත්‍යානුකූල අයිතිය සනාථ කිරීම සඳහා ලේඛණයේ පිටපතක්.
- අදාළ පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපතක්.
- බදු දීම සඳහා දේපළ සඳහා රජයේ තක්සේරු සහතිකයේ පිටපතක්.

උනන්දුව දක්වන ලංසු කරුවන් යෝජනා/විස්තර (අත්සන සහිතව) ඇතුළුව මිල ගණන් 2026 සැප්තැම්බර් 30 දින පස්වරු 2.00 ට හෝ ඊට පෙර "සභාපති - ප්‍රසම්පාදන කමිටුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක - 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ - 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් පාලන අංශයෙහි ටෙන්ඩර් පෙට්ටියට දැමීම සිදුකල යුතුය.

අසම්පූර්ණ අයදුම්පත්, ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත්, ෆැක්ස්, විද්‍යුත් තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් යොමු කරන ලද අයදුම්පත් ලංසු ඇගයීමෙන් ඉවත් කරනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන මිල ගණන් බහාලනු ලබන කවරයෙහි ඉහල වම් කෙළවරේ "කාර්යාල පහසුකම් බදු හෝ කුලී පදනම මත ලබා ගැනීම - මාතර දිස්ත්‍රික්කය" ලෙස සටහන් කල යුතුය.

මේ සම්බන්ධයෙන් යම් විමසීමක් වෙතොත් 0112-554624 යන අංකය ඔස්සේ පරිපාලන නිළධාරී සම්බන්ධ කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

සභාපති

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරය

අංක-177, නාවළ පාර,

නාරාහේන්පිට, කොළඹ - 05.

2026-09-08